03 වන පිටුවෙන් (අබා)

ද නැත. එහෙත් එබදු මතවාදයක් අපේ සමාජයේ තිබුණි. මුනිදාස කුමාරතුංගයන් රැපියල් තෙන්නකෝනුත් හරහා අරිසෙන් අහුබුදු වන් ද බොහෝ විට තම මත වාද වලට ඒ විශ්වාසය ඇතුල් කරගෙන ඇත. එහෙත් අබා චිත්‍රපටය මේ මත වාදයට සාක්ෂි නොසපයයි.

අබා චිත්‍රපටය වංශකථා වලට අනුගතව ඒ මත පිහිටා රචනා වූවෙකි. මා නියැදි කොට ගන්නේ ක්‍රිස්තු පූර්ව 5 වන ශත වර්ෂයයි. ඉතිහාස විද්‍යාවට අනුව මේ වකවානුව අයත් වන්නේ පූර්ව ඓතිහාසික යුගයටයි. ඓතිහාසික යුගය ආරම්භ වන්නේ දේවානම් පියතිස්ස රජුට පසුවය. විජයාවතරණයේ සිට මහින්දාගමනය දක්වා කොටස පූර්ව ඓතිහාසික යුගයයි. විජයාව තරණයට පෙර යුගය ප්‍රාග් ඓතිහාසික යුගයයි. ප්‍රාග් ඓතිහාසික යුගය බොහෝ අවිශ්වාසයන්ගෙන් ගහන වන අතර පූර්ව ඓතිහාසික යුගය අවුල් සහගත බවකින් යුක්ත ඇතැයි ඉතිහාසඥයෝ දක්වති.

අපට වංශ කතා සාහිත්‍ය ලියන්නට කියාදී ඇත්තේ මිහිඳු මා හිමියන්ය. බුද්ධොත්පත්තියේ සිට මහින්දාගමනය දක්වා ඉන්දිය කතාව උන්වහන්සේ මහා විහාරවාසී භික්ෂූන් වහන්සේට කියාදුනි. එතැන් සිට වර්තමාන කතාව අනාගතය දක්වා උන්වහන්සේලා ශ්‍රැතියෙන් රඳාගන ආවෝය. සීහලට්ඨකථා මහා වංශය ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ දීම ලියැවී තිබුණි. ක්‍රි. ව. 5 වන සියවසේ දී මහානාම හාමුදුරුවන් මහාවංශය ලියූයේ ඉතිහාස සාහිත්‍යයට ජනශ්‍රැතියල පුරා විද්‍යාව එක් කරමින්ය. එහෙයින් පූර්ව ඓතිහාසික යුගයේ විජයාව තරණයෙන් සිට මුටසීව දක්වා කතන්දරයේ හිදැස් බොහෝමයක් මහානාම හාමුදුරුවන්ට පුරවන්නට සිදුවී තිබුණි. මේ හිස්තැන් පිරවීම අදත් විමර්ශනයට භාජනය වී තිබේ.

මේ හිස් තැන නිසා සිංහල ජාතියේ උප්පත්තිය පිලිබඳ අද විවිධ ප්‍රවාද මතුවී ඇත. මහාවංශයට අනුව සිංහල ජාතියේ උප්පත්තිය පිලිබඳව කිසිදු සැකයක් නැත. "සිංහයා ලානය කල හෙයින් සිංහල වූ" කියා උන් වහන්සේ ඉතාමත් විශ්වාස වන්ත ලෙස සිංහල ජාතියේ උප්පත්තිය වංග දේශයේ ලාට රටට යොමු කරයි. සිංහබාහු විසින් තම පීක්ග් සිංහයා මැරූ හෙයින් අප සිංහලයන් වී ඇතැයි මහාවංශයට අනුව අප විශ්වාස කරමු. සිංහබාහුගේ දෙතිසක් වූ පුතුන්ගෙන් විජය පමණක් ලංකාවට පැමිණෙයි. ඔහු සිංහයා ලානය කල පරපුරේ සිංහල වූ හෙයින් ඔහුගෙන් පටන්ගන්නා අප සිංහලයන් වූනායි අපි දෙකේ පන්තියේ සිට උගෙන ගෙන ඇත්තෙමු.

විජය රජු ලංකාවට පැමිණෙන්නට පෙර සිටම අප හෙලයන් වී සිටි බව පෙන්වා දෙන හෙලහවුල මහානාම හාමුදුරුවන්ට වඩා වෙනස් මතයක් ඉදිරිපත් කරයි. හෙලයන් වර්ග සතරකි. යක්කල නාගල දේවල රාක්ෂ මේ සතර ආකාර හෙලයන් සිවු හෙල ලෙස හඳුන්වා ඇත. සිවුහෙල සිහල වී පසුව සිංහල වුනායි හෙල හවුල විශ්වාස කරයි.

මේ මත දෙකටම වඩා වෙනස් මතයක් අද වන විට සාකච්ඡා වෙමින් පවතියි. විජය රජු තම්මැන්නාවට එන්නට පෙර මෙරට දියුණු ජනාවාස තිබූ බවත් විජය සහිත සිංහ වංශය මෙරට දේශීය හෙල ජනයා සමඟ මිශ්‍ර වූ බවත්ල මේ මිශ්‍ර ජාතිය සිංහුහෙල සිංහල වූ බවත් මේ අලුත් වංශයේ අන්තර්ගත වෙයි.

මේ මතයට අනුව මෙරට ජන කොට්ඨාශයට ගෞතම බුදුහාමුදුරුවන්ට ශාඛ්‍ය වංශය හරහා බැඳුනු ලඟ නෑ දෑ කම ද පවතින අතර බලංගොඩ මානවයාගේ සිට පැවත එන මෙරට මුල් පදිංචිකාර හෙලයන්ගේ සම්බන්ධයද සාධාරණිකරණය වන්නේය. මේ නව සංකල්පයට අනුව සිංහල ජාතිය ගොඩනැගීමට ජන වර්ග තුනක සහභාගීත්වයක් පැනී ඇත. වයඹ දිග ඉන්දීය සිංහ වංශයල ගිණිකොන දිග ඉන්දීය ශාඛ්‍ය වංශය සහ ලංකාවේ මුල් පදිංචිකාර සිවු හෙළය.

සිංහුහෙල වර්ගයා බිහි කිරීමේ පුරෝගාමීත්වය දරන්නේ පණ්ඩුකාභය රාජෝත්පත්තියයි. පඬු අබා කුමරුන්ගේ සීයා සිංහ වාංශික පඬුවස්දේව්ය. ආච්චී ශාඛ්‍ය වංශික භද්‍රකච්චායනාය. මව සිංහුශාඛ්‍ය එකතු වූ උන්මාද චිත්‍රාය ය. පඬු අබාගේ පිය පාර්ශවයේ සීයා ශාඛ්‍ය වාංශික දිසායු කුමාරයාය. හේ පණ්ඩුශාක්‍ය පුත්‍රයාය. භද්‍රකච්චායනාවගේ සහෝදරයාය. පණ්ඩුශාක්‍ය යනු අමිතෝධනගේ පුත්‍රයාය. අමිතෝධන යනු සුද්ධෝදනගේ සහෝදරයාය. සුද්ධෝදන යනු සිදුහත් කුමාරයාගේ පියතුමාය. පඬු අබාගේ පියා දීඝගාමිණී කුමාරයාය. දීඝගාමිණී දීඝායු කුමාරයාගේ පුත්‍රයායි. දීඝායු කුමාරයා සඳහා ආවාහ කුල කුමරියක් ඉන්දියාවෙන් ගෙන්වූ බවට කිසිදු සාක්ෂියක් වංශ කථාවල නැත. ඉන්දියාවෙන් ලංකාවට පැමිණි සියලුම සිංහ කුමාරවරුන් සඳහා අභිශේක කුමාරියන් ඉන්දියාවෙන් ගෙන්වූ බවට වංශ කථා සාක්ෂි ඉදිරිපත් කරයි. විජයට පමණක් නොව විජයගේ සත් සියයක් සේනාවටම කුමාරිවරු සත් සියයක් මධුරාවෙන් ගෙන්වූයේය. පඬුවස්දේව් සඳහාද අභිශේක ශාඛ්‍ය කුමාරිය ඉන්දියාවෙන් ගෙන්වූයේය. විජය සිට පඬුවස්දේව් දක්වා මෙහි පැමිණි සිංහ වාංශික රාජකීය කුමාරවරුන් ලංකාවේදී මිශ්‍ර නොවුනි.

එහෙත් භද්‍රකච්චායනාගේ සහෝදරයින් සය දෙනා සඳහා කුල කුමරියන් ඉන්දීය දේශයෙන් ගෙනා බවක් සඳහන් නොවන්නේ මන්ද? මේ කුමාරවරු ලංකාවේ ''බින්නබැස්ස'' බව නොවේද? එහි අදහස මේ කුමාරවරු උපතිස්ස නුවර නොරැඳී ලංකාව පුරා පැතිරී ඒ ඒ ජනපද වල පදිංචි වී ඔවුන්ගේ නම් වලින් ඒ ජනපද නම් කිරීමට තරම් මෙරට හෙලයන් හා මිශ්‍ර විය.

වයඹදිග වෛදික සිංහයින් හෙලයින් සමඟ මිශ්‍ර නොවීමත් ශක්‍යයින් හෙළයින් සමඟ මිශ්‍ර වීමත් යන විපර්යස්ථයන් විග්‍රහා කරගත යුතු කාලය එළඹ ඇත. වෛදික සිංහ වාංශිකයින් හින්දු දේවධාර්මිකයින් වන අතර පණ්ඩුශාක්‍යගේ දරුවන් බෞද්ධයින් යැයි අපි විශ්වාස කරමු. භද්‍රකච්චායනාගේ බෞද්ධ පිලිවෙත් වල තිබූ ප්‍රාණඝාත විරෝධයේ හේතුවෙන් පඬුඅබා බිහි වූ අයුර අපට වංශ කථා කියා දෙයි. වෛදිකයින්ට නොතිබුනු මධ්‍යම ප්‍රදිපදාවක් ශාඛ්‍යයින්ට තිබෙන්නට ඇත. මේ නිරහංකාර බෞද්ධ කුමාරවරු මෙරට හෙලයින්ගේ සිත දිනාගන්නට ඇත. මූලධර්මවාදයෙන් දුපෙන නොවූ මේ මධ්‍යම ප්‍රතිපගත බෞද්ධ කුමාරවරු මෙරට හෙලයන් සමග' විවාහ ගනුදෙනු පැවත්වීය.

රෝහණල විජිතල උරුවෙලල අනුරාධල රාමල සහ දිගායු යන කුමාරවරු ඒ ඒ පලාත් වල බින්න විවාහ සිදුකරගත්හ. දීගානු කුමාරයා විවාහ වූ ප්‍රදේශය දීගවාපිය ලෙස නම් විය. මේ කුමාරවරුන් විවාහ වන්නේ මෙරට කුල ධුරාවලියේ ඉහලම ස්ථරය සමගයි. මෙරට සිටි සිව් හෙලයින් හඳුන්වන අනුක්‍රමය වනාහි යක්කල නාගල දේවල රාක්‍ෂ යන අනුක්‍රමයයි. භාරතීය අනුක්‍රම කුලය හඳුන්වන්නේ බ්‍රාහ්මණ ක්‍ෂත්‍රීයල වෛශ්‍යල සහ ක්‍ෂුද්‍ර යන පිලිවලට. ඒ පිලිවෙල වනාහි කුලට වටිනාකම අනුව සකස් වී ඇත. ඉහලම කුලය බ්‍රාහ්මණයි. මුලින්ම කියන්නේ ඒ කුලයයි. ලංකාවේදී මුලින්ම කියවෙන්නේ යක්ක ගෝත්‍රයයි. රාජ්‍යත්වය සමඟ කෙලින්ම ගනුදෙනු කලේ යක්ක ගෝත්‍රයයි. විජය රජු මෙරටට එන විට මෙරට පාලනය කලේ මහා කාලසේන නම් යක්ෂ ගෝත්‍රික පාලකයාය. කුවන්නා යනු ඔහුගේ නැගණියයි. මව විජුලාය. දියණිය පෝලමිත්තාය. සියල්ලන්ම යක්ක ගෝත්‍රික උසස් කුලදරුවන්ය. ඉන් අපට ගම්‍ය වන්නේ දීගායු කුමාරයා නැගෙනහිර ප්‍රදේශයේදී විවාහ වූ හෙළ කුල කුමරිය වනාහි කුවේණියගේ පරම්පරාවෙන් පැවත එන යක්ක ගෝත්‍රික කුල කාන්තාවක බවයි.

මේ දෙදෙනාගේ විවාහයෙන් බිහිවන කුමාරයා දීඝගාමිණිය. හේ පිය පක්ෂයෙන් ශාඛ්‍ය වාංශිකය. මව් පක්ෂයෙන් යක්ක ගෝත්‍රිකය. යක්කයින්ගේ මේ යුගය වනාහි මාතෘ මූලික සාමාජයක් වේ. එය සාමාජ විද්‍යාව විසින් ඔප්පු කොට හමාරය. මාතෘ මූලික සමාජය යනු මව් පක්ෂයෙන් පරම්පරාව කියන සමාජයයි. එබැවින් යක්ක ගෝත්‍රිකයින්ගේ පිළිගැනීමට අනුව දීඝගාමිණී කුමාරයා මාතෘ මූලික යක්ක කුමාරයෙකි.

දීඝගාමිණී නැගෙනහිර පාලාතේ ඉපදී වසර කීපයකට පසු උපතිස්ස නුවර පඬුවස්දෙව් රජු මාලිගයේ දී කුමරි උපතක් සිදුවෙයි. ඒ භද්‍රකච්චායනාගේ බාල දියණිය වූ චිත්‍රා කුමරියයි. ඇගේ කේන්ද්‍රය විමසූ නෛමිත්තකයින්ගේ ප්‍රකාශය රජවාසල බිය වැද්දීණි. මේ කුඩා බිළිඳිය වැඩිවිය පත්වී ඇගේ කුසින් උපදී පිරිම දරුවා ඇගේ සහෝදරයින් මරා මේ රටේ රජ වන බව ප්‍රකාශයට පත්වුණි. ඇය මරා දැමීමට වැඩිමල් සහෝදරයින් උත්සහ කලද භද්‍රකච්චයානා යෙදූ උපක්‍රමයෙන් ඇගේ දිවි රැකුණි. කුමරිය එක්ටැම් ගෙයක රඳවනු ලැබීය.

මහාකාලසේනගෙන් හිස්වූ දේශ්‍රීයයන්ගේ උරුමය යලි ලබාගැන්මට යක්ක ගෝත්‍රිකයෝ නොබිදෙන උත්සහයක යෙදී සිටියහ. පඬුවස්දෙව් රජ්ජුරුවන්නට නගරයක් බිහිකිරීමට නොහැකි වුනේත් බලකොටුවකට වී රජකරන්නට සිදුවුනේත් යක්ක උවදුරු නිසාය. කොයි මොහොතේ හෝ යලි රජකම ලබා ගැන්මට කැස කැවෙමින් සිටි යක්කයින්ට උපතිස්ස නුවර නෛමිත්තකයින්ගේ අනාවැකිය නැසීයන්නට හේතුවක් නැත. චිත්‍රා කුමාරිය එක්ටැම්ගෙයක වසන බවත් ඇගේ ගැබ තුල ඔටුන්න හිමි කුමාරයා බිහිවීමට නියමිත බවත් ඔහු දැනගෙන සිටියහ. මේ කථා ප්‍රවෘත්තියේ දෛවය ඉතාමත් සරදම් සහගතය. දැන් දීඝවාපීයේ මාතෘ මූලික යක්ක කුමාරයෙක් සිටී. හේ පිය පාර්ශවයෙන් ශාඛ්‍ය වංශිකය නෑකමින් චිත්‍රා කුමරියගේ ඇවැස්ස මස්සිනාය. ඔහු චිත්‍රා හා විවාහ වුවහොත් ඉන් ලබන දරුවා තුල සිංහ වංශය ශාක්‍ය වංශය සහ යක්ක ගෝත්‍රයක් මිශ්‍ර වී පවතී.

වංශ කථාවල සඳහන් පරිදි දීඝගාමිණී කුමාරයා දිගාමඩුල්ලෙ සිට උපතිස්ස නුවර එන්නේ මිත්‍රයින් දෙදෙනෙකු සමඟය. ඒ චිත්තරාජ සහ කාලවේල යන යක්ක ගෝත්‍රිකයින් දෙදෙනාය. මා සිතන්නේ මේ යක්ක ගෝත්‍රිකයින්ගේ උපක්‍රමයක් ලෙසයි. මේ උපක්‍රමය සැලසුම් කරන්නේ චිත්තරාජ විසිනි. හේ උපතිස්ස නුවර දී පඬුවස්දෙව් රජු එකඟ කරවාගෙන එක්ටැම් ගෙයි ආරක්ෂක සෙනවි ධුරයට පත්වෙයි. එක්ටැම්ගෙයි කවුළුව පිහිටා තිබුනේ පඬුවස්දෙව් රජුගේ යහන් ගබඩාව අසලින් යයිද මහා වංශයේ කියවෙයි. දීර්ඝ සැලැස්මකින් පසු චිත්තරාජ විසින් දීඝගාමිණී කුමරුට චිත්‍රාව සම්මුඛ කරවයි. ඔහු කර්කටක යන්ත්‍රයේ ආධාරයෙන් එක්ටැම් ගෙය තරණය කරයි. ඔවුන් දෙදෙනාගේ ප්‍රේම විවාහයේ හේතුවෙන් චිත්‍රා ගැබ් ගනී. ඇය ගැබ් ගත් බව සැලවූ සැනින් චිත්‍රාවගේ සහෝදරවරු කිපී දඩුවම් කරන්නේ දීඝගාමිණිට නොවේ. දඩුවමට පාත්‍ර වන්නේ චිත්තරාජ සහ කාලවේලයි. එහි තේරුම කුමක්ද? මේ ගැබ් ගැන්වීම යක්ක ගෝත්‍රිකයින්ගේ සැලැස්මක් බවත් මේ දේශපාලන කුමන්ත්‍රණයේ කැරලි නායකයින් ලෙස චිත්තරාජ කාලවේල හඳුනාගත් බවත් නොවේද ඉන් ගම්‍ය වන්නේ?

චිත්තරාජ කාලවේල දෙදෙනා මරණින් පසු කුමාරයාගේ ආරක්ෂාවට කැප වූ යකුන් උනැයි මහා වංශයේ කිවුවේ ඇයි? මේ නායකයින් තම ගෝත්‍රය වෙනුවෙන් දිවිහිමියෙන් කැපවී කටයුතු කරන දේශප්‍ර්‍රේමියින් යැයි සංකේතවත්ව කිව් හැටි නොවේද? ඉන්පසු මේ ආත්මයෙන් නිරන්තරයෙන් කුමාරයාගේ ආරක්ෂාවම කැපවූ බවත් කුමාරයා රජවූ පසු දකුණු දොරටුවේ චිත්තරාජත් වම් දොරටුවේ කාලවේලත් දේවාල ඉදිකලබවත් මහාවංශයේ කියයි.

මිනිසෙකු දේවත්වයට පත්වේන්නේ ඇයි? පුද්ගලික අභිමතාර්ථ මත මරණයට පත්වූ අයෙකු දේවත්වයට පත්වූ උත්පත්ති කතාවක් අපේ දේවධූරාවලියේ නැත. මව්බිම රැකගැනීමට ගෝත්‍රයම බලය ලබා දීමට ප්‍රාණ පරිත්‍යාග වූ නර විරුවෝ මෙරට විසින් දේවත්වයට පත් කොට ඇත. එහෙයින් මහාවංශයේ දීඝගාමිණීට වඩා වැඩි ඉඩක් චිත්තරාජට ලබා දී තිබේ. ඉතිහාසය ලබා දුන් ඒ ශ්‍රේෂ්ඨත්වය හඳුනා ගැනීමට තරම් සමාජ දැනුමක් නැති ආධුනික කිළි ඇත්තියන් එය අනාචාරයකට ලඝු කිරීම වනාහි ජාතියක් විසින් දඬුවම් ලබා දිය යුතු බරපතල ජාතීද්‍රෝහී වරදකි.

මගේ චිත්‍රපටය ආරම්භ වන්නේ චිත්‍රාවට කුමාරයා උපදින භ්‍රාන්ති අවස්ථාවෙනි. ඉන්පසු සිදුවන්නේ කුමාරයා රැකගැනීමේ නාටකීය කාල පරාසයයි. ඒ කාලය තුල දීඝ ගාමිණීට කුමක් සිදු වුනාදැයි දක්වන්නට වංශ කතා කරුවන් වෙහෙස නොවෙයි. චිත්‍රපට කරුවාටද එය අනවශ්‍යයි. මාතෘ මූලික සමාජයේ දරුවා සොයන්නේ මව පමණි. වංශ කථා කරුවෝ ඒ සමාජ විද්‍යා මතය තුළ රැදෙති. කුමාරයා වැඩිවියට පත්වී මාමා වරුන්ට විරුදධව යුද්ධය මෙහෙය වන විට චිත්‍රාව තම පුත්‍රයාට මසුරන් දහසක්ද යවා යුද්ධයට උදවු කල වග මහා වංශය කියයි. කුමාරයාටත්ල දොරමඬලාවටත්ල වංශ කථා කාරයින්ටත්ල මටත් දීඝගාමිණී පිළිබඳ වගක් නැත.

මෙම ලිපිය කියවන ඔබට මම බරපතල අභියෝගයක් භාර දෙමි. මගේ චිත්‍රපටය යලි හොඳින් නරඹන්න. එහි කවර හෝ තැනක අබා කුමාරයාගේ පියා චිත්තරාජ යැයි කියන්නේදැයි සොයන්න. පූර්ව විනිශ්චයන් මත ඉතිහාසය හදාල යුතු නැත. ඉතිහාසය යනු ආගමක් හෝ මූලධර්මයක් හෝ සිද්ධාන්තයක් හෝ නොවන්නේය. ඉතිහාසය යනු බහු විධ මතවාද මණ්ඩපයකි. පූර්ව විනිශ්චයන්හි සිටියහොත් මේ විපර්යාස මතවාදී සියල්ලක්ම දැකගත නොහැකි වනු ඇත. අබා යනු දේශීය චින්තනයේ උප්පත්ති කථාව යැයි මම මුලින්ම සඳහන් කර ඇත්තෙමු. උප්පත්ති කථා පුරාතෝක්ති මිත්‍යාවන් ලෙස සැලකූ කාලයක් තිබුණි. සමාජ මනෝවිද්‍යාව සොයා ගැනීමෙන් පසු ඒවා යථා මූලයන් සේ සැලකීමට ලෝකය පුරුදු වී සිටීයි. අබා ඉතිහාස ගවේශණයකි. එය හෙළිදරව් කරන්නේ මෙරට පුරවැසියන්ගේ උත්පත්ති කථාවයි. අබා නැරඹීමට අතුරු සිඳුරු නැතිව ගලන්නේ මේ රටේ මහ පුරවැසි ගංගාවයි. අබා නැරඹීම සමාජ කාරණාවක් වී තිබේ. එය වැලැක්වීමට ආධූනික අතලොස්සකට හැකියාවක් නැත.



ජැක්සන් ඇන්තනී

**මෙම ලිපිය කියවන ඔබට මම බරපතල අභියෝගයක් භාර දෙමි. මගේ චිත්‍රපටය යලි හොඳින් නරඹන්න. එහි කවර හෝ තැනක අබා කුමාරයාගේ පියා චිත්තරාජ යැයි කියන්නේදැයි සොයන්න. පූර්ව විනිශ්චයන් මත ඉතිහාසය හදාල යුතු නැත. ඉතිහාසය යනු ආගමක් හෝ මූලධර්මයක් හෝ සිද්ධාන්තයක් හෝ නොවන්නේය. ඉතිහාසය යනු බහු විධ මතවාද මණ්ඩපයකි.**